DOI : 10.31357/fhssmst.2011.00683

# ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් පිළිබඳව
# අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

පල්ලෙක් කම්කානම්ගේ ධම්මික ප්‍රියන්ත

24 NOV 2011

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා
සපුරාලීම සඳහා 2011.07.22 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ. ආර්. පී. චානක උදයකුමාර මහතාගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙහි අන්තර්ගත කිසිදු කොටසක් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරමි.

2011-11-24 ..........

දිනය

..............................

පී.කේ.ධම්මික ප්‍රියන්ත

## උපදේශකවරයාගේ සහතිකය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සදහා පී. කේ. ධම්මික ප්‍රියන්ත විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ පිළියෙළ කරනු ලැබුවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගයීම් කටයුතු සදහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව තවදුරටත් මෙයින් සහතික කරමි.

ඒ.ආර්.පී. චානක උදය කුමාර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

2011-11-24
.............................................

.............................................

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂකයා විසින් අවසාන නිබන්ධනය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

ඒ. ආර්.පී චානක උදය කුමාර,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

2011-11-24
.........................................

.........................................

# පටුන


පිටු අංකය

- **පටුන** i-ii
- **සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන්** iii
- **ස්තුතිය** iv
- **සංක්ෂිප්තය** v
- **පළමු වැනි පරිච්ඡේදය** 1-11

**හැඳින්වීම සහ ක්‍රමවේදය**

1.1 හැඳින්වීම
1.2 අධ්‍යයනයේ අරමුණු
1.3 පර්යේෂණයේ ගැටළුව
1.4 මූලාශ්‍ර භාවිතය
1.5 අධ්‍යයන ක්ෂේත්‍රය
1.6 නියැදිය
1.7 දත්ත රැස් කිරීම
1.8 අධ්‍යයනයේ සීමා
1.9 පර්යේෂණ දුෂ්කරතා
1.10 දත්ත විශ්ලේෂණය
1.11 පරිච්ඡේදකරණය

- **දෙවැනි පරිච්ඡේදය** 12-41

**සංකල්පීය විග්‍රහය හා න්‍යායාත්මක පසුබිම**

2.1 හැඳින්වීම
2.2 සංකල්පීය විග්‍රහය
2.3 න්‍යායාත්මක විග්‍රහය
2.4 දිවිනසා ගන්නා ත්‍රස්තවාදය ආශ්‍රිත න්‍යායාත්මක විග්‍රහය

- **තෙවනි පරිච්ඡේදය** 42-60

**මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ආරම්භය , විකාශනය හා මෑත කාළින ප්‍රවණතා**

3.1 ලෝකයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ආරම්භය, විකාශනය හා මෑත කාලින ප්‍රවණතා

3.2 ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ආරම්භය, විකාශනය හා මෑත කාලින ප්‍රවණතා

- **සිව්වන පරිච්ඡේදය** 61-143

**ක්ෂේත්‍ර අධ්‍යයනය හා දත්ත විශ්ලේෂණය**

4.1 හැඳින්වීම

4.2 මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සමාජ පසුබිම

4.3 පුද්ගලයන් මරාගෙන මැරෙන බෝම්බකරුවන් බවට පත්වීමට බල පා ඇති හේතු සාධක

4.4 මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ චරිත ස්වභාවය

4.5 දිවිනසා ගන්නා ත්‍රස්තවාදය ආශ්‍රීත ක්‍රම ශිල්ප

4.6 මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර පාලනය හා නිවාරණය

4.7 මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ මානසික ස්වභාවය

4.8 සිද්ධි අධ්‍යයන

- **පස්වන පරිච්ඡේදය** 144-159

**නිගමන හා යෝජනා**

5.1 නිගමන

5.2 යෝජනා

- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 160-163
- උප ග්‍රන්ථය

## සංඛ්‍යා වගු සහ ප්‍රස්ථාර සටහන්


| සංඛ්‍යා වගු | | පිටු අංකය |
|---|---|---|
| වගු අංක 4 ඃ 1 | මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ වයස් මට්ටම | 62 |
| වගු අංක 4 ඃ 2 | ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස මියගිය බොම්බකරුවන්ගේ වයස් මට්ටම | 63 |
| වගු අංක 4 ඃ 3 | මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ අධ්‍යාපන මට්ටම | 66 |
| වගු අංක 4 ඃ 4 | මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ භාෂා දැනුම | 68 |
| වගු අංක 4 ඃ 5 | මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම | 69 |
| වගු අංක 4 ඃ 6 | මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සහෝදර සහෝදරියන්ගේ අධ්‍යාපන මට්ටම | 71 |
| වගු අංක 4 ඃ 7 | මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර වල ඉලක්ක වල ස්වාභාවය | 96 |
| වගු අංක 4 ඃ 8 | මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරීම සඳහා භාවිතා කල උපක්‍රම | 97 |

| ප්‍රස්තාර සටහන් | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාර අංක 4 ඃ 1 | මරාගෙන මැරෙන බෝම්බකරුවන් අයත් සමාජ කුලය අනුව | 67 |

## ස්තුතිය

දශක තුනකට වැඩි කාලයක් ශ්‍රී ලාංකික ජන සමාජය පීඩාවට පත් කළ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළ නිමාවට පත්ව ඇති මුත් ජාත්‍යන්තර වශයෙන් විවිධ ස්වරූපයන්ගෙන් ක්‍රියාත්මකව පවතින වකවානුවක ත්‍රස්තවාදයේම තවත් එක් ස්වරූපයක් වන මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර නොඑසේනම් දිවි නසා ගන්නා බෝම්බ ප්‍රහාර පිළිබඳව සහ මරාගෙන මැරෙන බෝම්බකරුවන් සම්බන්ධයෙන් මෙම අධ්‍යනයේදි අවධානය යොමු කොට තිබේ. මෙවැනි පර්යේෂණ කාර්යයක පවත්නා කාලින වැදගත් කම පිළිබඳව මා දැනුවත් කොට ආරම්භයේ සිටම ඊට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබා දෙමින් මෙහි උපදේශක ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.ආර්.පී. චානක උදය කුමාර මහතා වෙත ප්‍රථමයෙන් මාගේ කෘතඥතාවය පිරි නමමි.

මෙම පර්යේෂණ කාර්යය වඩාත් සාර්ථක කර ගැනිම සඳහා අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දෙමින් නිතර මා උනන්දු කළ ආචාර්ය ප්‍රනිත් අබේසුන්දර මහතා මෙන්ම විෂයානුබද්ධ කරුණු පැහැදිලි කර දෙමින් ඉතා කැමැත්තෙන් සහය දක්වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුෂා එදිරිසිංහ මහත්මිය ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. මෙම කාර්යය සඳහා නන් අයුරින් සහය දුන් සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශප්‍රධානතුමා ප්‍රමුඛ සියලුම කථිකාචාර්ය මහත්ම මහත්මීන් මෙහිදි ගෞරවයෙන් සිහිපත් කරමි.

මෙම අධ්‍යයනයේ ඇති වැදගත්කම පෙන්වා දෙමින් මා දිරිමත් කළ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වන ජයන්ත කුලතිලක, චන්ද්‍රා වාකිෂ්ට, නන්දන මුණසිංහ, විජය අමරසිංහ යන මහත්මාවරුන් මෙහිදි විශේෂයෙන් සිහිපත් කරමි. මෙම පර්යේෂණ කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය පොත්පත් හා ලිපි ලේඛන ලබා දෙමින් මා දිරිමත් කළ ඉද්දමල්ගොඩ මහතාව ද මෙහිදි කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. මෙම පර්යේෂණ නිබන්ධය පිළියෙළ කිරිමේදි මා වෙත සහය දුන් ප්‍රසන්න අල්විස්, නන්දන රත්නායක, ශ්‍රියා ජයරාණි, විශාරා ද සිල්වා, කාන්ති ප්‍රියදර්ශනි අමරසිංහ, සේපාලිකා, යන මහත්ම මහත්මීන් මෙම කාර්යය සාර්ථක කර ගැනිම සඳහා විශේෂ කැපවීමකින් ක්‍රියා කල අතර ඒ පිළිබඳව මෙහිදි සිහිපත් කිරිම යුතුකමක් ලෙස සළකමි. එසේම නන් අයුරින් සහය දුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ත්‍රස්තවාදි විමර්ශන කොට්ඨාසයේ සියලු නිළධාරින් ද මෙහිදි සිහිපත් කරමි. අවසාන වශයෙන් මෙම භාරදූර කාර්යය සාර්ථක කර ගැනිමෙහි ලා නිරන්තරයෙන් මා දිරිමත් කරමින් මානසික වශයෙන් ඊට අවශ්‍ය සහය ලබා දුන් දිපිකා හා චනිතු වෙත මාගේ කෘතඥතාව පළ කරනු කැමැත්තෙමි.

## සංක්ෂිප්තය

දිවි නසා ගන්නා ත්‍රස්තවාදය (Suicide Terrorism) ක්‍රියාත්මක කරන ත්‍රස්තවාදි සංවිධාන අතරින් දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය එය ඉතාමත් සාර්ථක හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කළ ත්‍රස්තවාදි කණ්ඩායම ලෙසට ඉතිහාස ගත වි ඇත. ලෝකයේ විවිධ රටවල් අදටත් දිවිනසා ගන්නා බෝම්බ ප්‍රහාර වලින් පීඩාවට පත්ව ඇති අතර ශ්‍රී ලංකාවද පුරා දශක දෙකක කාලයක් මෙවැනි ප්‍රහාර වලින් හිංසනයට පත්ව ඇත. ත්‍රස්තවාදය විවිධ ස්වරූපයන්ගෙන් පවතින අතර එහි බිහිසුණු සහ ප්‍රචණ්ඩකාරි ස්වරූපය දිවි නසා ගන්නා බෝම්බ ප්‍රහාර බව කිව යුතුය. මෙම ගැටළුව පාලනය කිරිම සඳහා ලෝකයේ දියුණු රටවල් විවිධ පියවර ගෙන ඇතත් මෙතෙක් එය සම්පූර්ණයෙන්ම පාලනය කිරිමට නොහැකි වි ඇත.

මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර වලින් දශක දෙකකට වැඩි කාලයක් පිඩාවට පත් රටක් ලෙස ශ්‍රී ලංකාව තුල මරාගෙන මැරෙන ත්‍රස්තවාදය ක්‍රියාත්මක විමට බලපාන ලද හේතු සාදක මොනවාද යන්න අධ්‍යයනය කිරිම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වි ඇත. විශේෂයෙන්ම කුමන තත්ත්වයන් යටතේ වුවත් පුද්ගලයා තම ජිවිතය විනාශ වන බව දනිමින්ම තවත් පුද්ගලයන් ගේ සහ ජිවිත හා දේපල විනාශ කිරිමට පෙළඹීම සුවිශේෂි තත්ත්වයකි. එමෙන්ම ත්‍රස්තවාදි සංවිධානයක් ලෙස දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරිමේදි යොදා ගන්නා ලද ක්‍රම ශිල්ප හා ඒවා පාලනය කිරිමේ ආරක්ෂක අංශ අනුගමනය කල ක්‍රියා කලාපයන් මොනවාද යන්න මෙහිදි විමසා බැලේ. එපමණක් නොව මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර වලින් දැඩිව පීඩාවට පත් රටක් ලෙස නැවත එවැනි තත්ත්වයක් ඇති නොවිමට අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න යෝජනා කිරිමද මෙහිදි සිදුව ඇත.

# පළමු වැනි පරිච්ඡේදය

## හැඳින්වීම සහ ක්‍රමවේදය

1.1 හැඳින්වීම

1.2 අධ්‍යයනයේ අරමුණු

1.3 පර්යේෂණයේ ගැටළුව

1.4 මූලාශ්‍ර භාවිතය

1.5 අධ්‍යයන ක්ෂේත්‍රය

1.6 නියැදිකරණය

1.7 දත්ත රැස් කිරීම

1.8 අධ්‍යයනයේ සීමා

1.9 පර්යේෂණ දුෂ්කරතා

1.10 දත්ත විශ්ලේෂණය

1.11 පරිච්ඡේදකරණය

## 1.1 හැඳින්වීම

මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ශ්‍රී ලංකාවට පමණක් නොව ලෝකයේ රටවල් ගණනාවක ආරක්ෂාවට බලවත් තර්ජනයක් එල්ල කර ඇත. මරාගෙන මැරෙන ප්‍රහාර ලෝක ඉතිහාසයේ අවස්ථා කිහිපයක සිදු ව ඇති අතර පළමුවරට කියවෙන්නේ දෙවන ලෝක යුද්ධයේදී ජපානයේ කමිකාස් (kamikaz) ගුවන් නියමුවන් පුපුරණ ද්‍රව්‍ය සහිත ගුවන් යානා ඇමරිකානු ඉලක්ක වෙත ප්‍රහාර එල්ල කිරිමත් සමගයි. එතැන් පටන් 1980 දක්වා මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ගැන වාර්තා නොවූ අතර නැවත 1980 දශකයේ සිට ලෝකය පුරා මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල වන්නට විය. දෙවන ලෝක යුද සමයේදී පිළිගත් රජයක හමුදා සාමාජිකයින් මෙම ප්‍රහාර එල්ල කළමුත් 1980 පසුව ලෝකයේ ත්‍රස්තවාදී සංවිධාන වල සාමාජිකයින් ප්‍රහාර එල්ල කිරිමත් කැපි පෙනෙන ලක්ෂණයක් වී ඇත. ලොව පුරා ක්‍රියාත්මක ත්‍රස්තවාදී සංවිධාන තම අරමුණු මුදුන්පත් කර ගැනිම සඳහා විවිධාකාරයට ප්‍රචණ්ඩත්වය මුදවා හරිමින් සිටිති. ඒවා අතර මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ප්‍රචණ්ඩත්වය මුදා හරින බිහිසුණු ක්‍රමය බවට අවිවාදයෙන් කිව යුතුය. මෙම ප්‍රහාර වල ඇති විශේෂ බව වන්නේ තමන්ගේ ජිවිතය විනාශ වන බව හොඳාකාරවම දැනගෙන පුද්ගලයින් ඒ සඳහා ඉදිරිපත් වීමය.

මරාගෙන මැරෙන බෝම්බකරු යන්නට නිර්වචන විශාල සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇතත් තමාගේ ජිවිතයද විනාශ වන බව හොඳාකාරවම දනිමින් අන් අයගේ ජිවිත හා දේපල විනාශ කිරිම අරමුණු කොටගෙන පුපුරණ ද්‍රව්‍ය යොදාගෙන ප්‍රහාර එල්ල කරන පුද්ගලයෙකු ලෙස සරලව නිර්වචනය කළ හැකිය. පුද්ගලයා තම ජීවිතය විනාශ වන බව හොඳාකාරව දනිමින්ම කුමන තත්ත්වයක් යටතේ වුවද එවැනි ඉහල කැපකිරීමක් සිදු කිරීමට ඉදිරිපත් වීම සුවිශේෂි තත්ත්වයක් ලෙස සැළකිය යුතුය. මෙම ක්‍රියාව ත්‍රස්තවාදයේ ම කොටසක් වන අතර එය අපරාධයක් ලෙසද හැඳින්විය හැකිය. මන්ද ත්‍රස්තවාදය ද අපරාධයක් ලෙස අර්ථ දැක්වෙන බැවිනි. එසේම අන් අයගේ ජිවිත හා දේපල විනාශ කිරිම අරමුණු කොට ගෙන ප්‍රහාර එල්ල කිරීමත්, එම ක්‍රියාකාරකම් තුල අපරාධයක් සමන්විත වීමට අවශ්‍ය සාවද්‍ය චේතනාව මෙන්ම සාවද්‍ය ක්‍රියාවද ගැබ්ව තිබීම නිසා අපරාධ විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයෙන් මරාගෙන මැරෙන බෝම්බරුවන් පිළිබඳ හා මරාගෙන මැරෙන ත්‍රස්තවාදය පිළිබඳව අධ්‍යයනය කිරිම අපරාධ විද්‍යාවේ විෂය පථයට ආලෝකයක් වනු ඇත.

මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර හේතුවෙන් පීඩාවට පත් රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැකි අතර දශක දෙකකට ආසන්න කාලයක් ශ්‍රී ලාංකිකයෝ මෙම ගැටළුවෙන් පීඩා විඳින ලදි. වටිනා ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ වූ අතර මිල කළ නොහැකි ආර්ථික හානියක් ද වී ඇත. මෙම ගැටළුවට මුහුණ පා ඇති ලෝකයේ අනෙකුත් රටවල තත්ත්වයද මෙයම වන අතර එතෙක් මෙතෙක් කාලය තුළ එල්ල වූ බරපතළම බෝම්බ ප්‍රහාරය ලෙස 2011. 09. 11 වන දින ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල කළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය සඳහන් කළ හැකිය. එසේම වර්තමානය වන විට ලෝක ප්‍රජාව භීතියට පත් කිරීමට මරාගෙන මැරෙන බෝම්බකරුවාට හැකියාව ලැබී ඇත. මෙම ගැටලුවට බරපතල ලෙස මුහුණ පා ඇති රටවල් අතර පකිස්ථානය, ඇෆ්ඝනිස්ථානය, ඉරාකය සහ ඊශ්‍රායලය හැඳින්විය හැකි අතර මෙම රටවල් වල දිනකට අඩුම වශයෙන් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එකක්වත් වාර්තා වෙමින් පවතී. ඉහත සඳහන් කළ රටවල් වලට අමතරව ඇමරිකාව ප්‍රමුඛ යුරෝපීය රටවල් ද මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ඉලක්ක බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ පළමු මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය ලෙස 1987 ජුලි මස 05 වන දින යාපනය නෙල්ලිඅඩි යුධ හමුදා කඳවුරට දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයකු විසින් එල්ල කල ප්‍රහාරය සඳහන් කළ හැකිය. එතැන් සිට දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා අතින් 2009 මැයි මස 19 වන දින පරාජයට පත් වන අවස්ථාව දක්වා සාර්ථක මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර 100 කට වැඩි සංඛ්‍යාවක් එල්ල කර ඇත. මෙම ප්‍රහාර අතර ලෝකයේ රාජ්‍ය නායකයන් දෙදෙනෙකු ඉලක්ක කර ගනිමින් එල්ල කරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන් වඩාත් සුවිශේෂී වේ. එසේම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර, ශ්‍රී ලාංකික දේශපාලන, ආර්ථික හා සමාජ පරිසරය වෙත ඇති කරන ලද පීඩනය අති මහත්ය.

ශ්‍රී ලාංකික ජන සමාජය දීර්ඝ කාලයක් මුළුල්ලේ පීඩාවට පත් කරන ලද මෙම ගැටලුව පිළිබඳව සිදුව ඇති විද්‍යාත්මක අධ්‍යයනයන් ඉතා සීමිතය. දැනට ශ්‍රී ලංකාව තුළ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල නොවුවද ඊට මුහුණ දුන් රටක් ලෙස මෙම ගැටළුව පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් හා කාලෝචිත වේ. මෙම අධ්‍යයනයේදී මරාගෙන මැරෙන

බෝම්බකරුවන්ගේ සමාජ පසුබිම, ඔවුන් මරාගෙන මැරෙන බෝම්බකරුවන් බවට පත් වීමට බලපාන ලද හේතු සාධක සහ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රම ශිල්ප මොනවාද යන්න පරීක්‍ෂා කිරීම මූලික අරමුණු කොට ගනිමින් අපරාධ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයක් මත පිහිටා සිදු කරනු ලැබේ.

## 1 .2 අධ්‍යයනයේ අරමුණු

01. මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සමාජ පසුබිම හදුනා ගැනිම

02. පුද්ගලයින් මරාගෙන මැරෙන බෝම්බකරුවන් බවට පත් වීම සඳහා හේතු වන සාධක අධ්‍යයනය කිරිම

මෙහිදි පුද්ගලයන් දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට සම්බන්ධ වීමට බලපාන ලද හේතු පිළිබදව විමර්ශනයට භාජනය කරන අතරම මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ චරිත ස්වභාවය කෙබඳුදැයි සලකා බලනු ලැබේ.

03. මරාගෙන මැරෙන බෝම්බකරුවන් භාවිතා කරන ක්‍රම ශිල්ප හා උපක්‍රම විමර්ශනය කිරිම.

මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරිම සඳහා දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය අනුගමනය කරන උපක්‍රම මෙහිදි සලකා බලන අතර මරාගෙන මැරෙන බෝම්බකරුවන් බඳවා ගැනිම, පුහුණු කිරිම, ප්‍රහාරක ඉලක්ක තෝරා ගැනිම සහ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ දිවි නසා ගන්නා මානසික තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාම යන කරුණු පිළිබඳව විමර්ශනය කිරිම.

04. මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ගැටළු පාලනය හා නිවාරණය සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග සහ ඒවායේ ඵලදායිතාවය අධ්‍යයනය කිරීම.

මෙහිදි මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සිදු කිරිමට දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය අනුගමනය කරන ලද උපක්‍රම, මෙම ප්‍රහාර වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා

රජයේ ආරක්ෂක අංශය ඇතුලු පොලිසිය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල ඵලදායිතාවය අධ්‍යයනය කිරීම සිදු වේ.

05. ආරක්ෂක අංශවල අත්අඩංගුවට පත් වීමෙන් පසු මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ මානසික ස්වභාවය අධ්‍යයනය කිරීම.

## 1. 3 පර්යේෂණ ගැටළුව

ශ්‍රී ලංකාවේ ජන ජිවිතයට හා දේපල වලට තර්ජනයක් වී ඇති අපරාධකාරී චර්යා රටාවන් අතුරින් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර බරපතල ගැටළුවක් බවට පත්ව ඇත. මෙම ප්‍රහාර හේතුවෙන් තම ජිවිතය ද විනාශ වන බව හොදාකාරව දනිමින්ම පුද්ගල ජිවිත හා දේපල විනාශ කිරිමට පුද්ගලයා පෙළඹෙන අතර ඒ සදහා ඔවුන් පොළඹවන සාධක, එම ප්‍රහාර එල්ල කිරිම සදහා ඔවුන් උපයෝගි කර ගනු ලබන ක්‍රම ශිල්ප, ඒවා පාලනය කිරිම සදහා ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වන්නේය.

## 1 .4 මුලාශ්‍ර භාවිතය

ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනයේදී කාණ්ඩ දෙකකට අයත් මූලාශ්‍ර පදනම් කර ගනිමින් දත්ත රැස් කෙරිණි. එනම් ප්‍රාථමික මුලාශ්‍ර (Primary Sources) හා ද්විතික මුලාශ්‍ර (Secondary Sources) වශයෙනි.

අධ්‍යයන ක්ෂේත්‍රය වෙත ගොස් සුදුසු පර්යේෂණ ක්‍රමවේද අනුගමනය කරමින් රැස් කරන ලද දත්ත පර්යේෂණ අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් ප්‍රාථමික මූලාශ්‍ර ලෙස යොදා ගතිමි. මේ සදහා ප්‍රහාර එල්ල කිරීමට ප්‍රථම අත්අඩංගුවට ගත් මරාගෙන මැරෙන බෝම්බකරුවන්, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මෙහෙයවන ලද හා මරාගෙන මැරෙන බෝම්බකරුවන්

පුහුණු කරන ලද පුද්ගලයන් සහ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර විමර්ශනය කරන ලද විමර්ශන නිලධාරින් යොදා ගන්නා ලදී. මෙහිදී මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ සමාජ පසුබිම, පුද්ගලයින් මරාගෙන මැරෙන බෝම්බකරුවන් බවට පත් වීමට හේතු වු සාධක, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරිමට භාවිතා කරන ලද උපක්‍රම, එම ප්‍රහාර වැළැක්වීමට ගෙන ඇති ක්‍රියා මාර්ගවල ඵලදායිතාවය සහ ඉදිරියේදි මෙවැනි ප්‍රහාර වැළැක්වීමට කටයුතු කළ හැකි ආකාරය සම්බන්ධව අදාළ තොරතුරු සොයා ගන්නා ලදී.

පර්යේෂණ මාතෘකාවට අදාලව න්‍යායාත්මක හා සංකල්පීය කරුණු අර්ථ විවරණය කිරීම සඳහා ද්විතීයික මූලාශ්‍ර සම්බන්ධයෙන් මූලික අවධානයක් යොමු කළෙමි. ඒ සඳහා අපරාධ විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අදාලව පළවී ඇති ශාස්ත්‍රිය ග්‍රන්ථ, ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ මෙන්ම පර්යේෂණ වාර්තා සහ වෙනත් අදාල ලිපි ලේඛන පරිශීලනය කරන ලදී. මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර පිළිබඳ පොලිස් විමර්ශන වාර්තා, මරාගෙන මැරෙන බෝම්බකරුවන් පිළිබඳ ලිය වී ඇති පර්යේෂණ ග්‍රන්ථ හා ලිපි ඇතුලුව ලෝකය තුළ මෙතෙක් මෙම විෂය පිළිබඳ වාර්තා වී ඇති තොරතුරු රාශියක් ඒකරාශි කර ගැනීමට මේ තුළින් හැකි විය. විශේෂයෙන් අන්තර්ජාලය (Inter Net) බහුලව පරිශීලනය කරන ලදී.

## 1. 5 අධ්‍යයන ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනයේදි නිශ්චිත අධ්‍යයන ක්ෂේත්‍රයක් හඳුනා ගත නොහැකි වු අතර මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කිරිමට පුහුණුව ලත් ඒ ප්‍රහාර එල්ල කිරිමට ප්‍රථම ආරක්ෂක අංශ වල අත්අඩංගුවට පත් පුද්ගලයින් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. එසේම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මෙහෙයවන ලද සහ බෝම්බකරුවන් පුහුණු කරන ලද පුද්ගලයින් ද යොදා ගන්නා ලදි. මොවුන් සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් නියෝජනය කරන ලද අයවලුන් වුහ.